**අධිරාජ්‍ය විරෝධී ජන අරගලය සහ පුවත්පත්**
**(ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඇසුරෙන් කරන තුලනාත්මක අධ්‍යයනයක්)**

R.M.P. Subashini Menike Rathnayake, Department of Hindi, University of Kelaniya

ආසියා මහද්වීපයට අයත් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සියවස් ගණනාවක් අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිත බවට පත්ව තිබිණි. එය හේතුකොටගෙන මේ රටවල්වල සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන මූලමණ්ඩලවල බරපතල වෙනස්කම් ඇති වූ බව ඓතිහාසික සංසිද්ධි අධ්‍යයනයේ දී පෙනී යයි.
ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අධිරාජ්‍ය විරෝධී ජන-අරගලවල ස්වරූප පිළිබඳ අධ්‍යයනයේදී ඒවායේ පැහැදිලි වෙනස්කම් රැසක් දක්නට ලැබේ. විශේෂයෙන් මෙහි කේන්ද්‍රීය මාතෘකාව වන පුවත්පත් සම්බන්ධව මෙම ආස්ථානය නිරවද්‍ය වේ. අධිරාජ්‍ය විරෝධී ජන අරගලයේදී ඉන්දියාවේ මාධ්‍ය භාවිතාව (පුවත්පත්, සඟරා) කටයුතු කර ඇත්තේ සමස්ත භාරතයේ විමුක්තිය උදාකර ගැනීම උදෙසාය. භාරතයේ විවිධ ජන-වර්ග මෙම අරගලයේ කොටස්කරුවන් බවට පත්කරගැනීමට එම මාධ්‍යවලට හැකිවූයේ ඓතිහාසික වශයෙන් සංවිධානගතවී තිබීම නිසා බව මූලාශ්‍රය පෙන්වා දෙයි.
ශ්‍රී ලංකාවේ අධිරාජ්‍ය විරෝධී අරගලය ඉන්දියාවට සාපේක්ෂව හාත්පසින්ම වෙනස් මුහුණුවරක් ගත් බව ලාංකීය මූලාශ්‍රය පසක් කර දෙයි. ශ්‍රී ලංකාවේ මාධ්‍ය (පුවත් පත්, සඟරා) තුළින් සෘජු අධිරාජ්‍ය විරෝධියක් පෙන්නුම් නොකළ අතර පන්සල කේන්ද්‍ර කරගත් මාධ්‍ය භාවිතාවක් ප්‍රදර්ශනය වුණි. ඇතැම් විට ඒවා තුළ අධිරාජ්‍යවාදී ඕනෑ එපාකම් ප්‍රකාශ වුන බව සඳහන් කළ යුතු කරුණකි. යටත්විජිත සමයේ ප්‍රකාශිත වූ ඇතැම් කතෘ මුලික පුවත්පත් යටත් විජිත බැමි ගැන කතා කළ ද ජනතාව සංවිධානගත කිරීමේ කාර්යේදී මන්දගාමී බවක් ප්‍රදර්ශනය කළ බව හඳුනාගත හැකිය. ඉන්දියාවේ අධිරාජ්‍ය විරෝධී අරගලයට සෑම ජන කොටසක්ම දායක වුවද ( හරිජනයා සිට බ්‍රාහ්මණ දක්වා ) ශ්‍රී ලාංකික අධිරාජ්‍ය විරෝධී අරගලයට දායක වූයේ සිංහල උගත් බෞද්ධ විඥානවාදී සුළුතරයක් පමණි.
ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ නිදහස් අරගලවල මාධ්‍ය භාවිතාව පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමේ වැදගත්කම මෙහිදී ඉස්මතු කරගත හැකිය. ඒ අනුව එකී උභය නිදහස් අරගලවල මාධ්‍ය භාවිතාවේදී විද්‍යමාන වන පැහැදිලි පංති ප්‍රභේද විද්වත් ලෝකය හමුවේ නිරාවරණය කිරීම මෙහිදී අභිමත කරුණකි. අධ්‍යයන ක්ෂේත්‍රයේ පෘථුලත්වය හේතුකොට ගෙන හින්දි සහ සිංහල පුවත්පත් කෙරෙහි සෘජු අවධානය යොමු කෙරේ.

මුඛ්‍ය පද : නිදහස් අරගලය, අධිරාජ්‍යවාදය, යටත් විජිත බැමි, සංවිධානගත මාධ්‍ය, පංති ප්‍රභේද